*සැ. යු.* - 2019.12.06 වැනි දින පළ වූ අංක 2,153 දරන *ගැසට් පත්‍රයේ* IV (අ) කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,154 - 2019 දෙසැම්බර් මස 13 වැනි සිකුරාදා - 2019.12.13**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III කොටස - ඉඩම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව |
|---|---|
| ඉඩම් නිරවුල් කිරීම පිළිබඳ දැන්වීම් : | |
| ප්‍රාරම්භක දැන්වීම් .... ... ... ... | — |
| අවසාන නියෝග .... ... ... ... | — |
| ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා දැන්වීම් ... ... | — |
| ආණ්ඩුවේ ඒජන්තවරු විසින් ඉඩම් විකිණීම : | |
| බස්නාහිර පළාත .... ... ... ... | — |
| මධ්‍යම පළාත .... ... ... ... | — |
| දකුණු පළාත .... ... ... ... | — |
| උතුරු පළාත .... ... ... ... | — |
| නැගෙනහිර පළාත .... ... ... ... | — |
| වයඹ පළාත .... ... ... ... | — |
| උතුරු මැද පළාත .... ... ... ... | — |
| ඌව පළාත .... ... ... ... | — |
| සබරගමුව පළාත .... ... ... ... | — |

| | පිටුව |
|---|---|
| ඉඩම් නිරවුල් කිරීමේ නිලධාරී විසින් ඉඩම් විකිණීම : | |
| බස්නාහිර පළාත .... ... ... ... | — |
| මධ්‍යම පළාත .... ... ... ... | — |
| දකුණු පළාත .... ... ... ... | — |
| උතුරු පළාත .... ... ... ... | — |
| නැගෙනහිර පළාත .... ... ... ... | — |
| වයඹ පළාත .... ... ... ... | — |
| උතුරු මැද පළාත .... ... ... ... | — |
| ඌව පළාත .... ... ... ... | — |
| සබරගමුව පළාත .... ... ... ... | — |
| ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම් .... ... | — |
| ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම් .... ... | 292 |
| ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම් .... ... | — |
| ඉඩම් හිමි ගැමි ක්‍රමය යටතේ ඉඩම් දීම .... ... | — |
| ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම් .... ... | 294 |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2020 ජනවාරි මස 03 වැනි දින පළකෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2019 දෙසැම්බර් මස 20 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

" යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට්* පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2019 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

291- B 081586 - 353 (2019/12)
E -1

# ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම්

## ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උප වගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම- (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි

දකුණු පළාත් සභාවේ මාතර දිස්ත්‍රික්කයේ අකුරැස්ස ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම්/ නියෝජ්‍ය ඉඩම් කොමසාරිස් (අන්තර් පළාත්) ඕ. වී. චන්දන තිලකරත්න වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 (4) උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1995.11.13 දින ප්‍රදානය කර ඇති අංක මා/4/ප්‍ර/20529 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන බෝධිරාජ විහාරය ඉදිරිපිට, තෙපුදෙනිය, කනංකෙ කඩවීදිය පදිංචි කහගලගේ සාමෙල් වෙත ප්‍රදානය කොට මාතර දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක LDO 517 යටතේ 1996.01.24 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛණයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටියද ඔහු/ ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත් වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධයක් ඇත්නම් එය 2019.12.29 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතුය.

උපලේඛනය

මාතර පරිපාලන දිස්ත්‍රික්කයේ අකුරැස්ස ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වැලිගම්/ කෝරළේ නිමලව ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ නිමලව නමැති ගමේ පිහිටා ඇත්තාවූ ද, ප්‍රමාණයෙන්/ අක්කර 00 රූඩ් 01 පර්චස් 00ක් විශාලත්වය ඇත්තාවූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම : සෙම්ඩේල් වත්ත

| | |
|---|---|
| උතුරට | : රජයේ අනවසර ඉඩම |
| නැගෙනහිරට | : රජයේ අනවසර ඉඩම |
| දකුණට | : දයාවතී බස්නායකගේ ඉඩම (මා/අකු/නිම/371/471) |
| බටහිරට | : කොස්ගොඩ බඩල්ගේ ඥාණතිලක ගේ ඉඩම (මා/අකු/නිම/371/471) |

ඕ. වී. චන්දන තිලකරත්න,
ප්‍රාදේශීය ලේකම්,
අකුරැස්ස.

2019 ඔක්තෝබර් මස 11 වැනි දින.

12-350/1

## ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උප වගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම- (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි.

දකුණු පළාත් සභාවේ මාතර දිස්ත්‍රික්කයේ අකුරැස්ස ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අකුරැස්ස ප්‍රාදේශීය ලේකම් ඕ. වී. චන්දන තිලකරත්න වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 (4) උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1996.02.28 දින ප්‍රදානය කර ඇති අංක මාර/4/ප්‍ර/33051 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන තිබ්බොටුවාව පදිංචි ගම්පලගේ ලීලාවතී වෙත ප්‍රදානය කොට මාතර දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක 3048 යටතේ 1996.07.31 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැතිවීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටියද ඔහු/ ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත් වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධයක් ඇත්නම් එය 2019.12.29 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතුය.

උපලේඛනය

මාතර පරිපාලන දිස්ත්‍රික්කයේ අකුරැස්ස ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වැලිගම්/ කෝරළේ උතුර ගලබඩහේන ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ ගලබඩහේන නමැති ගමේ පිහිටා ඇත්තාවූ ද, ප්‍රමාණයෙන්/ අක්කර 01 රූඩ් 02 පර්චස් 00ක් විශාලත්වය ඇත්තාවූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ ද,

| | |
|---|---|
| ඉඩමේ නම | : ගලබඩහේන, |
| උතුරට | : තිප්පලවත්ත, |
| නැගෙනහිරට | : දහනායක කුසුමාවතීගේ ඉඩම, |
| දකුණට | : පාර සහ දහනායක යාපා කුසුමාවතීගේ ඉඩම, |
| බටහිරට | : වික්‍රමනායක දොන් අන්ද්‍රියස්ගේ ඉඩම. |

ඕ. වී. චන්දන තිලකරත්න,
ප්‍රාදේශීය ලේකම්,
අකුරැස්ස.

2018 ජූලි මස 25 වැනි දින.

12-350/2

### ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උප වගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම- (104 වගන්තිය) සඳහා වූ නිවේදනය

දකුණු පළාත් සභාවේ මාතර දිස්ත්‍රික්කයේ මාතර කඩවත් සතර ප්‍රාදේශීය ලේකම් දිලිප් දර්ශන කුමාර වික්‍රමආරච්චි වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 (4) උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1983 මාර්තු 03 වන දින ප්‍රදානය කර ඇති අංක මාතර/ ප්‍ර5694 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන කැකණඳුර රිට්රිට්වත්ත පදිංචි උයනහේවාගේ ඥානසිරි වෙත ප්‍රදානය කොට මාතර දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාරයාලයේ අංක එල්. ඩී. ඕ. 189 යටතේ 1987.06.08 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උප ලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නිත්‍යානුකුල හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටියද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමේන් අනුප්‍රාප්තකභාවයට කෙනෙකු පත් වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියාකරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය 2019.12.29 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතුය.

උපලේඛනය

මාතර පරිපාලන දිස්ත්‍රික්කයේ මාතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කැකණඳුර දකුණ ග්‍රාම නිලධාරී වසමේ කැකණඳුර හා තල්පාවිල උතුර නමැති ගමේ පිහිටා ඇත්තා වූද, සර්වේ ජනරාල් භාරයේ ඇති සහ සර්වේ ජනරාල් වරයා විසින් සම්පාදිත අංක 0-25/35, 36, 43, 44 දරන ක්‍ෂේත්‍ර පත්‍රයෙහි සර්වේ ජනරාල් විසින් සම්පාදිත අංක. මු. පි. මාර 257 දරන කට්ටි කැඩීමේ පිඹුරේ අංක 153 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තවා වූද ප්‍රමාණයෙන් අක්කර 00, රූඩ් 00, පර්චස් 24ක් විශාලත්වය ඇත්තා වූද පහත දැක්වෙන පරිදි මායිම් වූද රජයේ ඉඩමඃ රිට්රිට්වත්ත ඃ

| | |
|---|---|
| උතුරට | : මු. පි. මාර 257හි 139, 138 කැබලි |
| නැගෙනහිරට | : මු. පි. මාර 257හි 154 කැබලි |
| දකුණට | : මු. පි. මාර 257හි 31 කැබලි |
| බටහිරට | : මු. පි. මාර 257හි 152 කැබලි |

ඩී. ඩී. කේ. වික්‍රමආරච්චි,
ප්‍රාදේශීය ලේකම්,
මාතර කඩවත්සතර.

2019 මාර්තු මස 19 වැනි දින.

12-350/3

### ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උප වගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම- (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි

දකුණු පළාත් සභාවේ මාතර දිස්ත්‍රික්කයේ, දික්වැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් බරණිගේ සරත් රන්ජිත වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 (4) උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1996.07.24 දින ප්‍රදානය කර ඇති අංක මාර/11/ප්‍ර/35581 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන ලුණුකලපුව පදිංචි ලොකු මරක්කලගේ දාවිත්සිංඤො වෙත ප්‍රදානය කොට මාතර දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක LDO 30 යටතේ 1997.01.06 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් එකී දීමනාපත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය 2019.12.29 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතුය.

උපලේඛනය

දකුණු පළාතේ මාතර පරිපාලන දිස්ත්‍රික්කයේ දික්වැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වැල්ලබඩ පත්තුවේ ලුණුකලපුව ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ ලුණුකලපුව නමැති ගමේ පිහිටා ඇත්තාවූ ද, සර්වේ ජනරාල් භාරයේ ඇති සහ සර්වේ ජනරාල් වරයා විසින් සම්පාදිත අංක 0 25/40 දරන ක්ෂේත්‍ර පත්‍රයෙහි අංක මු. පි. මාර. 150 දරන පිඹුරේ අංක 14 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තාවූ ද, ප්‍රමාණයෙන් හෙක්ටයාර්/ අක්කර 00, රූඩ් 00, පර්චස් 20.5 ක් විශාලත්වය ඇත්තවුද, පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම තැබෑරුම්හේන.

| | | |
|---|---|---|
| උතුරට | : | මු. පි. මාර 150හි, අංක 11 දරන ඉඩම් කැබැල්ල |
| නැගෙනහිරට | : | මු. පි. මාර 150හි, ප්‍රවේශ මාර්ගය |
| දකුණට | : | මු. පි. මාර 150හි, අංක 15 දරන ඉඩම් කැබැල්ල |
| බටහිරට | : | මු. පි. මාර 150හි, අංක 10, 16 දරන ඉඩම් කැබැල්ල |

බී. එස්. රංජිත්,
ප්‍රාදේශීය ලේකම්,
ප්‍රාදේශීය මහලේකම් කාර්යාලය,
දික්වැල්ල.

2019 ජුනි මස 26 වැනි දින.

12-350/4

**ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උප වගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම- (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි**

දකුණු පළාත් සභාවේ මාතර දිස්ත්‍රික්කයේ, පිටබැද්දර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ, ප්‍රාදේශීය ලේකම්/නියෝජ්‍ය ඉඩම් කොමසාරිස් (අන්තර් පළාත) කේ. ජී. ආර්. ජයනාත් වන මම, ඉඩම් සංවර්ධන ආඥා පනතේ 19 (4) උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1984.08.03 දින ප්‍රදානය කර ඇති අංක මාතර/ප්‍ර 8182 දරන ප්‍රදාන පත්‍රයන් හි හිමිකරු වන දැරංගල පදිංචි කුසුමාවතී පස්සපෙරුම වෙත ප්‍රදානය කොට කොටපොල දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක LDO 223 යටතේ 1990.08.01 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නිත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටියද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය 2019.12.29 දිනට පෙර මාවෙත ලිඛිතව දැනුම් දිය යුතුය.

උපලේඛනය

මාතර පරිපාලන දිස්ත්‍රික්කයේ පිටබැද්දර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මොරවක් කොරළේ බටහිර දැරංගල ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ දැරංගල නමැති ගමේ පිහිටා ඇත්තාවූද, මාතර මැනුම් අධිකාරී භාරයේ ඇති සහ සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත අංක XXXX දරන ක්ෂේත්‍ර පත්‍රයෙහි XXXX/සර්වේ ජනරාල් වරයා විසින් සම්පාදිත අංක අ.ග.පි. 27 දරන කට්ටි කැඩීමේ පිඹුරේ XXXX විසින් සම්පාදිත අංක XXXX දරන රේඛා සටහනේ අංක 1083 හා 1261 දරන බිම් කැබලි වශයෙන් පෙන්නුම් කොට ඇත්තාවූද ප්‍රමාණයෙන් පිළිවෙලින් හෙක්ටයාර්/අක්කර 00, 01 රූඩ් 00, 03 පර්චස් 24, 25ක් විශාලත්වය ඇත්තාවූද, පහත දැක්වෙන පරිදි මායිම් වූද රජයේ ඉඩම මහහේන, කළුගහවිලහේන ඉඩම :

| | | *108 කැබැල්ල* | *1261 කැබැල්ල* |
|---|---|---|---|
| උතුරට | : | අ.ග.පි. 27 හි 1051 කැබැල්ල | අ.ග.පි. 27 හි 1161, 1162 |
| නැගෙනහිරට | : | අ.ග.පි. 27 හි 1084, 1088 කැබැලි | අ.ග.පි. 27 හි 1260 කැබැල්ල |
| දකුණට | : | අ.ග.පි. 27 හි 1088 කැබැල්ල | අ.ග.පි. 27 හි 04 කැබැල්ල |
| බටහිරට | : | අ.ග.පි. 27 හි 1082 කැබැල්ල | අ.ග.පි. 27 හි 1263 කැබැල්ල |

කේ. ජී. ආර්. ජයනාත්,
ප්‍රාදේශීය ලේකම්,
පිටබැද්දර.

2019 මැයි මස 06 වැනි දින

12-350/5

---

# ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම්

ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය :- 4/10/59322.
පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය :- PLC/L2/LP/16/37.

**21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනයයි**

රත්නපුර දිස්ත්‍රික්කයේ, කොලොන්න ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් හබ්බෙලිආර ග්‍රාම නිලධාරී වසමෙ 11 කණුව ගමේ අ. ග. පි. 905 දරන පිඹුරේ කැබලි අංක 808න් කොටසක් පෙන්වීමට අඳින ලද දළ අනුරේඛනයේ දරන ප්‍රමාණයෙන් පර්. 05 ක් වූ රජයේ ඉඩම් කොටස වාණිජ කටයුතු සඳහා රූපසිංහගේ අසංක මංජුල මයා වෙත බදු ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් මෙහි පහත සඳහන් වේ :

අ.ග.පි. 905 දරන පිඹුරේ කැබලි අංක 808න් කොටසක් පෙන්වීමට අඳින ලද දළ අනුරේඛනයඃ පර්.05

| | | |
|---|---|---|
| *උතුරට* | : | කැබලි අංක 120 සහ 808 න් කොටසක් ; |
| *නැගෙනහිරට* | : | කැබලි අංක 813 ; |
| *දකුණට* | : | කැබලි අංක 810 සහ 808න් කොටසක් ; |
| *බටහිරට* | : | 808න් කොටසක්. |

02. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ :-

*(අ)* *බදු කාලය* .- අවුරුදු තිහයි. (30) (2019.07.11 වැනි දින සිට ඉදිරියට);

*වාර්ෂික බදු මුදල* .- බද්ද ක්‍රියාත්මක වන 2019 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000) වඩා අඩුවන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ වෙළෙඳපොල වටිනාකමින් 2%කි. බද්ද ක්‍රියාත්මක වන 2019 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000) වැඩිවන අවස්ථාවල දී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ වෙළෙඳපොළ වටිනාකමින් 4%කි. මෙම බදු මුදල සෑම අවුරුදු 05 කට වරක් ම සංශෝධනය විය යුතු අතර, එය කලින් අවුරුදු 05 අවසානයේ අය කළ වාර්ෂික බදු මුදලට 20%ක් එකතු විය යුතුය.

*වාර මුදල*.- වාර මුදලක් අය නොකෙරේ ;

(ආ) බදු ගන්නන් විසින් බද්ද ඇරඹුන දින සිට අවුරුදු 01ක් ඇතුළත දී ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතු ය. ;

(ඇ) බදු ගන්නන් විසින් මෙකී ඉඩම වාණිජ කටයුතු සඳහා හැර වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතු ය ;

(ඈ) පළාත් ඉඩම් කොමසාරිස්/ප්‍රාදේශීය ලේකම් සහ අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලටද මෙම බද්ද යටත් විය යුතුය;

(ඉ) සාදා ඇති ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වාගෙන යා යුතු ය;

(ඊ) ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටක බදු දීම අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ;

(උ) 2019.07.11 වැනි දින සිට අවුරුදු 05 ක අවම කාලයක් ඉක්මවීමට කලින් අතුරු බදු දීම් කළ නොහැක.

(ඌ) බදු කුළිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත.

මෙම නිවේදනය *ගැසට් පත්‍රයේ* පළකළ දින සිට සති 06ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතුන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බදු දෙනු ලැබේ.

එස්. ඒ. එරන්තිකා ඩබ්. කුලරත්න,
සහකාර ඉඩම් කොමසාරිස් (ඉඩම්),
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2019 දෙසැම්බර් මස 13 වැනි දින,
"මිහිකත මැදුර", ඉඩම් මහලේකම් කාර්යාලය,
1200/6, රජමල්වත්ත පාර, බත්තරමුල්ල හි
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

12-453

ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය :- 4/10/58210.
පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය :-
NP/28/04/2/SLO/41/1447.

## 21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනයයි

යාපනය දිස්ත්‍රික්කයේ, වඩමාරච්චි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මරුදන්කේනි ග්‍රාම නිලධාරී වසමේ තාලෙයියඩි ගමේ අංක PPNo. Ya 2779 පිඹුරේ කැබලි අංක 1 මගින් දක්වා ඇති ප්‍රමාණයෙන් හේක. 4.0470 අදාළව රජයේ ඉඩම් ආඥාපනත යටතේ වාණිජ කටයුතු සඳහා ජාතික ජලසම්පාදන හා ජලාපවාහන මණ්ඩලය වෙත බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් මෙහි පහත සඳහන් වේ.

අංක PPNo: YA 2779, ප්‍රමාණය : හෙක්. 4.0470

| | | |
|---|---|---|
| *උතුරට* | : | මනත්තාරි (රජයේ ඉඩමකි) ; |
| *නැගෙනහිරට* | : | මනත්තාරි (රජයේ ඉඩමකි) හා කැබලි අංක 02 ; |
| *දකුණට* | : | මනත්තාරි (රජයේ ඉඩමකි) අංක 02 ; |
| *බටහිරට* | : | මනත්තාරි (රජයේ ඉඩමකි) . |

03. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ :-

(අ) *බදු කාලය* .- අවුරුදු තිහයි. (30) (2019.07.11 වැනි දින සිට ඉදිරියට);

*වාර්ෂික බදු මුදල* .- බද්ද ක්‍රියාත්මක වන 2019 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000) වඩා අඩුවන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ වෙළෙඳපොල වටිනාකමින් 2%කි. බද්ද ක්‍රියාත්මක වන වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000) වැඩිවන අවස්ථාවල දී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ වෙළෙඳපොළ වටිනාකමින් 4%කි. මෙම බදු මුදල සෑම අවුරුදු 05 කට වරක් ම සංශෝධනය විය යුතු අතර, එය කලින් අවුරුදු 05 අවසානයේ අය කළ වාර්ෂික බදු මුදලට 20%ක් එකතු විය යුතුය.

*වාර මුදල*.- වාර මුදලක් අය නොකෙරේ ;

(ආ) බදු ගන්නන් විසින් බද්ද ඇරඹුන දින සිට අවුරුදු 01ක් ඇතුළත දී ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතු ය. ;

(ඇ) බදු ගන්නන් විසින් මෙකී ඉඩම වාණිජ කටයුතු සඳහා හැර වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතු ය ;

(ඈ) පළාත් ඉඩම් කොමසාරිස්/ප්‍රාදේශීය ලේකම් සහ අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලටද මෙම බද්ද යටත් විය යුතුය;

*(ඉ)* සාදා ඇති ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වාගෙන යා යුතු ය;

*(ඊ)* ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටක බදු දීම අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ;

*(උ)* 2019.07.11 වැනි දින සිට අවුරුදු 05 ක අවම කාලයක් ඉක්මවීමට කලින් අතුරු බදු දීම් කළ නොහැක.

*(ඌ)* බදු කුළිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත.

මෙම නිවේදනය *ගැසට් පත්‍රයේ* පළකළ දින සිට සති 06ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතූන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බදු දෙනු ලැබේ.

එස්. ඒ. එරන්තිකා ඩබ්. කුලරත්න,
සහකාර ඉඩම් කොමසාරිස් (ඉඩම්),
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2019 දෙසැම්බර් මස 13 වැනි දින,
"මිහිකත මැදුර", ඉඩම් මහලේකම් කාර්යාලය,
1200/6, රජමල්වත්ත පාර, බත්තරමුල්ල හි
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

12-454

---

ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය :-4/10/55843.
පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය :-ALC/KG/D/2/10/06 .

## 21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනයයි

කෑගල්ල දිස්ත්‍රික්කයේ, දෙහිඕවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් මාගම්මන ග්‍රාම නිලධාරී වසමේ මු. පි. කෑ. 3049 හි කට්ටි අංක 80 හි කොටසක් ප්‍රමාණයෙන් පර්. 03ක් වූ රජයේ ඉඩම කොටස සමිති කටයුතු සඳහා සීමාසහිත මාගම්මන සකසුරුවම් හා ණය ගනුදෙනු කරන සමූපකාර සමිතිය විසින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් මෙහි පහත සඳහන් වේ:

| | | |
|---|---|---|
| *උතුරට* | : | මහා මාර්ගය ; |
| *නැගෙනහිරට* | : | මහා මාර්ගය සහ කැබලි අංක 82 ; |
| *දකුණට* | : | කැබලි අංක 81,82 සහ කරන්නන්වෙල ; |
| *බටහිරට* | : | කැබලි අංක 79. |

03. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට හා පහත සඳහන් කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ :-

*(අ)* *බදු කාලය* .- අවුරුදු තිහයි. (30) (2019.10.18 සිට වසර 30ක් ඉදිරියට);

*වාර්ෂික බදු මුදල* .- ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත, 2019 වර්ෂයේ ඉඩමේ නොදියුණු වටිනාකමින් 2%කි.

*වාර මුදල*.- වාර මුදලක් අය නොකෙරේ;

*(ආ)* බදු ගන්නන් විසින් මෙකී ඉඩම සමිති කටයුතු සඳහා හැර වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතු ය ;

*(ඇ)* බදු ගන්නන් විසින් බද්ද ඇරඹුන දින සිට අවුරුදු 01ක් ඇතුළත දී ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතු ය.

*(ඈ)* සාදා ඇති/සාදන ලද ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වාගෙන යා යුතු ය;

*(ඉ)* ප්‍රාදේශීය ලේකම් සහ අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලට ද මෙම බද්ද යටත් විය යුතුය;

*(ඊ)* ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටක බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ;

*(උ)* 2019.10.18 වැනි දින සිට වසර 05ක් ගතවන තුරු මෙම ඉඩම බදුගත් කරුණ සාක්ෂාත් කර ගැනීම සඳහා වන අතුරු බදුදීම් හෝ පැවරීම් හැර වෙනත් අතුරු බදුදීම් හෝ පැවරීම් සඳහා අවසර දෙනු නොලැබේ. .

*(ඌ)* බදු කුළිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත.

*ගැසට්* නිවේදනය පළ වූ දින සිට සති 06ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතූන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බද්ද දෙනු ලැබේ.

එස්. ඒ. කලානි එම්. ධනසේකර,
සහකාර ඉඩම් කොමසාරිස්(ඉඩම්),
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2019 දෙසැම්බර් මස 13 වැනි දින,
බත්තරමුල්ල, රජමල්වත්ත පාර, "මිහිකත මැදුර",
ඉඩම් මහලේකම් කාර්යාලයේ, අංක 1200/6 හි ,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

12-501

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.